ගාල්ල අධ්‍යාපන කලාපය
ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන - 2018
කෘෂි හා ආහාර තාක්ෂණය
Agriculture Section

ඒකක පරීක්ෂණ ප්‍රශ්න පත්‍ර කට්ටලය 03 - පස

1) ආග්නේය පාෂාණයකට උදාහරණයක් වන්නේ

1. කිරිගරුඬ 2. නයිස් 3.ග්‍රැනයිට් 4. හුණුගල්

2) පසක පවතින ශාක වලට පහසුවෙන් ලබාගත හැකි ජලය වන්නේ

1. කේෂාකර්ෂණ ජලය 2. ජලාකර්ෂණ ජලය
3. ගුරුත්වාකර්ෂණ ජලය 4. කේෂාකර්ෂණ හා ගුරුත්වාකර්ෂණ ජලය

3) බෝග වගාවක් සඳහා සුදුසුම පාංශු ජල අවස්ථාව වන්නේ

1. සංතෘප්ත අවස්ථාව 2. ක්ෂේත්‍ර ධාරිතා අවස්ථාව
3. අතිරික්ත ජලය පවතින අවස්ථාව 4. ස්ථිර මැලවීමේ සංගුණක අවස්ථාව

4) පාංශු පැතිකඩක විශෝධන කලාපය ලෙස හඳුන්වනු ලබන්නේ

1. A කලාපය 2. B කලාපය 3.C කලාපය 4.R කලාපය

5) අවසාදිත පාෂාණ වලට අයත් වන්නේ

1. කිරි ගරුඬ 2. නයිස් 3. හුණු ගල් 4. ග්‍රැනයිට්

6) පස සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A. - පසේ ජලය රඳවා ගැනීමේ ධාරිතාව වැඩි කිරීම.
B. - පසට කැඩ්මියම් ලෙඩ් වැනි අයන නිදහස් කිරීම.
C. - පසේ කලිල ගුණාංග වැඩි දියුණු කිරීම.
D. - පාංශු ක්ෂුද්‍ර ජීවින්ගේ වර්ධනයට අවශ්‍ය උපස්ථර ලෙස ක්‍රියා කිරීම.

ඉහත ක්‍රියාවලීන් කාබනික ද්‍රව්‍ය හා සම්බන්ධ ක්‍රියාවන් වන්නේ

1. A B C ය 2. A B D ය 3. A C D ය 4. B C D ය

7) කොම්පෝස්ට් පොහොර සෑදීමේදී වර්මි කොම්පෝස්ට් පොහොර සැකසීමට ගන්නා ජීවී විශේෂය වනුයේ

1. කුහුඹුවන් 2. පත්තෑයන් 3. ගැඩවිලන් 4. බැක්ටීරියාවන්

8) ක්ෂේත්‍ර ධාරිතාවය පවතින පසක අඩංගු ජලය වන්නේ

1. කේෂාකර්ෂණ ජලය පමණි.
2. ජලාකර්ෂණ ජලය පමණි.
3. කේෂාකර්ෂණ හා ගුරුත්වාකර්ෂණ ජලය පමණි.
4. කේෂාකර්ෂණ හා ජලාකර්ෂණ ජලය පමණි.

9) බෑවුම් බිම්වල මතුපිටින් ගලායන ජලය සමඟ තුනී ස්ථරයක් ලෙස පස් අංශු සේදී යාම හඳුන්වන්නේ

1. විසිරි ඛාදනය 2. ස්ථරීය ඛාදනය
3. ඇලි ඛාදනය 4. දිය පහර ඛාදනය

10) අන්තර්ජාතික වර්ගීකරණයට අනුව 0. 002mm ට වඩා අඩු විශ්කම්භයක් සහිත ඛනිජ අංශු

1. මැටිය 2. රොන් මඩය 3. සියුම් වැලිය 4. රළු වැලිය

11)බෝග වගා කිරීම සඳහා වඩාත් සුදුසු පාංශු ව්‍යුහ ආකාරය වන්නේ

1. තනි ඛනිකා 2. ස්ථම්භික 3. කැටිති 4. අනු කෝණාකාර

12)පාංශු ද්‍රාවණයේ අයන සාන්ද්‍රණය වැඩි වීම නිසා පසේ

1. ආම්ලිකතාව ඇතිවේ 2. භාස්මිකතාව
3. ක්ෂාරීයතාව ඇතිවේ 4. ඛාදනය අඩුවේ

13)ආග්නේය පාෂාණයක් නිර්මාණය වන්නේ

1. විවිධ කුඩා ඛනිජ කොටස් බන්ධන කාරක මගින් බැඳීමෙනි.
2. මැග්මා සිසිල් වී ඝනීභවනය වීමෙනි.
3. විවිධ ඛනිජ වර්ග අධික උෂ්ණත්වයට භාජනය වීමෙනි.
4. විවිධ ඛනිජ වර්ග ජලය සමග ප්‍රතික්‍රියා වෙනි.

14)පසක ක්ෂාරීයතාව ඉවත් කිරීමට සිදුකල හැක්කේ

1. පසට අලු හුණු යෙදීමයි 2. පසට කාබනික ද්‍රව්‍ය යෙදීම
3. පස ජීවාණුහරණය කිරීමය 4. පස හොඳින් පෙරලීමයි

15)පාංශු සංරක්ෂණයට යොදා ගන්නා යාන්ත්‍රික ක්‍රමයකි.

1. සමෝච රේඛා අනුව වගා කිරීම.
2. සමෝච රේඛා මත පස් වැටි ඉදිකිරීම.
3. භෞතික භූමි වර්ගීකරණයට අනුව බෝග තෝරා ගැනීම.
4. ආවරණ වගා යෙදීම.

16)ශ්‍රී ලංකාවේ වියලි කලාපයේ පැතිරී ඇති ප්‍රධාන පස් කාණ්ඩය වන්නේ

1. රතු දුඹුරු පස 2. රතු කහ පොඩ්සොලික් පස
3. දියලු පස 4. ලැටරයිට් පස

17)පසක ස්ථිර මැලවීමේ අංකය සෙවීමේ දර්ශකයක් ලෙස බොහෝ විද්‍යාඥයින් භාවිතා කරනුයේ කුමක්ද?

1. පත්‍ර යුගල් 3ක් දක්වා වර්ධනය වූ සූරියකාන්ත පැලෑටිය.
2. පත්‍ර යුගල් 2ක් දක්වා වර්ධනය වූ කුඩළු පැලෑටිය.
3. පත්‍ර යුගල් 1කින් සමන්විත බෝංචි පැලෑටිය.
4. පත්‍ර යුගල් 4කින් සමන්විත මිරිස් පැලෑටිය.

18) PH කඩදාසි මගින් PH අගය සෙවීමේදී ආසෘත ජලය සහ පස් කලවම් කල යුතු අනුපාතය වන්නේ

1. 2:1 අනුපාතයට 2. 1:1 අනුපාතයට
3. 3:1 අනුපාතයට 4. 1:2 අනුපාතයටය

19)කැටායන හුවමාරු ධාරිතාවය මනින ඒකකය වන්නේ

1. පස් ග්‍රෑම් 50ට මිලි සමක විය යුතුය.
2. පස් ග්‍රෑම් 100ට මිලි සමක විය යුතුය.
3. පස් ග්‍රෑම් 10ට මිලි සමක විය යුතුය.
4. පස් ග්‍රෑම් 05ට මිලි සමක විය යුතුය.

20)වර්ණය නිවැරදිව නිර්ණය කිරීමට භාවිතා කරනුයේ

1. පාංශු වර්ණ සටහනය 2. මන්සල් වර්ණ සටහනය
3. ලිට්මස් වර්ණ සටහනය 4. PH වර්ණ සටහනය

11 ශ්‍රේණිය

ගාල්ල අධ්‍යාපන කලාපය

ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන - 2018

කෘෂි හා ආහාර තාක්ෂණය

Agriculture Section

ඒකක පරීක්ෂණ ප්‍රශ්න පත්‍ර කට්ටලය 03 - පස - පිළිතුරු පත්‍රය

1) 3

2) 1

3) 2

4) 1

5) 3

6) 3

7) 3

8) 4

9) 2

10) 1

11) 3

12) 1

13) 2

14) 2

15) 2

16) 1

17) 1

18) 2

19) 2

20) 2

WWW.PastPapers.WIKI
Past Papers Wiki - Download More Past Papers and Study Well!